" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk

පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

SLSI ISO 9001 SYSTEM CERTIFIED
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/FIN-AP/03/FI/08 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2020.05. 19 |
|---|---|---|---|---|---|

# මූල්‍ය චක්‍රලේඛ 02/2020

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
පළාත් කොමිෂන් සභාවල ලේකම්වරු (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු (බ.ප.),
දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් (බ.ප.),
අධිකාරිවල/ව්‍යවස්ථාපිත ආයතනවල සභාපතිවරු (බ.ප.),
බස්නාහිර පළාතේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරු.

## එකතු කල අගය මත බදු ගිණුම්ගත කිරීම

උක්ත මැයෙන් යුතුව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2019.10.29 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 270/2019 බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/2 හා 2020.05.14 දිනැති ලිපිය අනුව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව දැනුම් දී ඇත.

02. එකතු කල අගය මත බදු ගිණුම්ගත කිරීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල 248/2016 බස්නාහිර පළාතට අදාල කර ගනිමින් නිකුත් කරන ලද 2016.02.02 දිනැති මූල්‍ය චක්‍රලේඛ අංක 04/2016 ක්‍රියාත්මක කිරීමේදී ඇතැම් ආයතන එහි දක්වා ඇති ගිණුම් තැබීමට අදාළ උපදෙස් 2002 අංක 14 දරණ එකතු කල අගය මත බදු පණතේ බදු ගණනය කිරීම්වලට අදාල විධිවිධාන හා සම්බන්ධ කර නොගැනීම හේතුවෙන් යම් යම් ගැටළු පැන නැගී ඇති බව නිරීක්ෂණය විය.

03. විශේෂයෙන් මෙම චක්‍රලේඛය හඳුන්වාදීමේ අරමුණ වූයේ එකතු කල අගය මත බදු පණතේ විධිවිධාන අනුව ගණනය කල යෙදවුම් හා නිමවුම් බදු වටිනාකම ප්‍රධාන ලෙජර් ගිණුමක් හරහා ගිණුම්ගත කර වර්ෂය අවසානයේදී තවදුරටත් ගෙවිය යුතු හෝ ඉදිරි වර්ෂවලදී හිලව් කර ගැනීම සඳහා ඉදිරියට ගෙන යා හැකි ඉඩදෙනු ලබන යෙදවුම් බදු වටිනාකම අවසන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කිරීමය.

04. ඒ අනුව එකතු කල අගය මත බදු සඳහා ලියාපදිංචි වී ඇති අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් 2002 අංක 14 දරණ එකතු කල අගය මත බදු පණතේ ප්‍රතිපාදනයන්ට අනුව ඉඩදිය හැකි යෙදවුම් හා නිමවුම් බදු ගණනය කර පහත දැක්වෙන පරිදි වාර්ෂික මූල්‍ය ප්‍රකාශන යටතේ ගිණුම් ගත කල යුතුය.

I. එකතු කල අගය මත වූ බදු සඳහා 9185 දරණ එකතු කළ අගය මත බදු පාලන ගිණුම පවත්වාගෙන යා යුතු වේ.

II. මෙම ගිණුමට එකතු කල අගය මත බදු පණතේ දක්වා ඇති විධිවිධාන පරිදි ඉඩදිය හැකි යෙදවුම් බදු හර කල යුතු අතර නිමවුම් බදු බැර කල යුතුය.

III. ඒ අනුව වියදම් ගිණුම් ගත කිරීමේදී ඉඩදෙනු ලබන යෙදවුම් බදු ප්‍රමාණය එකී වියදම් ගිණුමට අධිභාර කර ඉඩදෙනු ලැබූ යෙදවුම් බදු රහිත වියදම ගිණුම්ගත කල යුතුය. එසේ වුවද වැය විෂය අංක 2101 සිට 2108 දක්වා වූ මූල්‍ය නොවන වත්කම් අත්පත් කර ගැනීම සඳහා වූ වියදම් දැරීමේදී ඉඩදෙනු ලබන යෙදවුම් බදු ඉහත දැක්වූ පරිදි අදාල වැය විෂයට අධිභාර කිරීම වෙනුවට ඉඩදෙනු ලබන යෙදවුම බදු අඩු කල වියදම අදාලවැය විෂයට හර කර ඉඩදෙනු ලබන යෙදවුම් බදු ප්‍රමාණය එකතු කල අගය මත බදු සඳහා වූ පාලන ගිණුමට හර කල යුතුය.විශේෂයෙන් නව සිගාස් පරිගණක පද්ධතිය හරහා මූල්‍ය නොවන වත්කම් ගිණුම් තැබීමේදී අදාල වැය විෂයන්ට සිදු කරනු ලබන අධිභාරයන් එහි වත්කම්හි අපහරණයන් ලෙස ගිණුම්ගත වන බැවින් මෙලෙස ඉඩදෙනු ලබන යෙදවුම් බදු එකී වැය විෂයන්ට අධිභාර කිරීමෙන් සිදු විය හැකි දෝෂයන් වලක්වා ගැනීම සඳහා මෙම ව්‍යාතිරේඛ ක්‍රමවේදය හඳුන්වා දී ඇත.

IV. මාසිකව හෝ කාර්තු පදනමින් එකතු කල අගය මත බදු ගෙවන අවස්ථාවලදී අදාල කාලපරිච්ඡේදයේ ඉඩදෙනු ලබන යෙදවුම් බදු වටිනාකමට වඩා ගෙවිය යුතු නිමවුම් බදු වටිනාකම වැඩිනම් එකී වැඩි නිමවුම් බදු ප්‍රමාණය එකතු කල අගය මත බදු පාලන ගිණුමට හර කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත පියවිය යුතු අතර ඉඩදෙනු ලබන නිමවුම් බදු වටිනාකම වැඩිනම් එම වටිනාකම ඊලඟ ගෙවීම් කාලපරිච්ඡේදය සඳහා ඉඩදිය හැකි යෙදවුම් බද්දේ කොටසක් ලෙස සලකා එකතු කල අගය මත බදු පාලන ගිණුමේ ඉදිරියට ගෙන යා හැක.

05. ඒ අනුව එකතු කල අගය මත බදු ගිණුම්ගත කිරීම සඳහා වන 2016.02.02 දිනැති මූල්‍ය චක්‍රලේඛ අංක 04/2016 මෙයින් අවලංගු කරනු ලැබේ.

එන්. බන්දුල ප්‍රේමකුමාර,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(මූල්‍ය),
ප්‍රධාන ලේකම්,පළාත් මුදල්
අමාත්‍යාංශ ලේකම් හා පළාත්
භාණ්ඩාගාර ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

පිටපත්: 01.විගණකාධිපති

02.අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)

03.පරිගණක දත්ත ක්‍රියාකරු.